# 14 නිර්මාණය හා විචාරය

**සාහිත්‍ය නිර්මාණය හා විචාරය එකිනෙක හා බැඳුණු අංශ දෙකකි. මේ දෙකෙහි නියැලිය යුතු ආකාරය හා ඊට අදාළ යෝග්‍යතා ගැන සලකා බැලීම වැදගත් වූවකි. මේ පාඩම ඉදිරිපත් කෙරෙන්නේ යථෝක්ත අවශ්‍යතා සපුරාලීම සඳහා ය.**

සාහිත්‍යය යන්න මුල දී පෙරදිග විචාරයෙහි යෙදී ඇත්තේ ශබ්ද හා අර්ථ දෙක සහිත නිර්මාණ උදෙසා ය. මේ නිර්මාණ ගද්‍ය, පද්‍ය, හා මිශ්‍ර හෙවත් නාට්‍ය වශයෙන් තෙයාකාර වේ. මේ අනුව ශබ්ද හා අර්ථ දෙකින් සරසන ලද රසවත් නිර්මාණ සාහිත්‍යය ලෙස හැඳින්විය හැකි ය.

සාහිත්‍යකරණය නිර්මාණාත්මක කාර්යයකි. නිර්මාණාත්මක ලේඛන මගින් කෙරෙන්නේ රසභාව දනවීම යි. එසේ නිර්මාණකරණයේ නියැලීමටත්, විචාරාත්මක ලෙස රසවින්දනයේ යෙදීමටත් කෙනකු තුළ පැවතිය යුතු මූලික ගුණාංග ගැන අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ.

සාහිත්‍ය නිර්මාණයක් බිහිවන්නේ සාහිත්‍යකරුවා තුළ පවත්නා ප්‍රතිභා ශක්තිය නිසා ය. අපූර්ව වූ යමක් නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රතිභාවයි. එසේ ම බොහෝ පොතපත කියවීමෙන් හා අත්දැකීම් මඟින් ලබාගත යුතු බහුශ්‍රැත භාව සාහිත්‍යකරුවකුට අවශ්‍ය වේ. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව ද සාහිත්‍යකරුවා තුළ තිබිය යුතු ය. මෙය හැඳින්වෙන්නේ ව්‍යුත්පත්තිය යනුවෙනි. එසේ ම සාහිත්‍යකරුවා නිරතුරු ව ම නිර්මාණ කාර්යයෙහි යෙදිය යුතු ය. සිය කාර්යය කෙරෙහි නිරන්තරයෙන් ලබන මේ අභ්‍යාසය සතතාභ්‍යාසය යි.

සාහිත්‍යයේ දී රස වින්දනය හා නිර්මාණය යන අංග දෙක ම එක හා සමාන වැදගත් කමක් දරයි. රස වින්දනය කිරීමට හෝ යහපත් විචාරයක යෙදීමට නම් බොහෝ සාහිත්‍ය නිර්මාණ කියැවීමේ පුරුද්දක් ඇතිකර ගත යුතු ය.

රස වින්දනයට අදාළ සහජ ශක්තිය වාසනා ගුණය නම් වේ. රසය විඳිය යුත්තකි. විචාරයෙන් හෝ තර්කයෙන් හෝ කිව හැක්කේ යම් නිර්මාණයක ගුණාත්මක බව පමණි. එහෙත් එහි රසය රසිකයා විසින් ම ප්‍රත්‍යක්ෂ කර ගත යුතු වූවකි.

සාහිත්‍යකරුවා අප හොඳින් ම දක පුරුදු ඉර, හඳ, අව්ව, වැස්ස ඇසුරු කොට නිර්මාණයක් කරයි. ප්‍රස්තුත වස්තුව ජනතාවට අරුමයක් නො වේ. එහෙත් ඒ ඇසුරු

කොට රචනා කෙරෙන නිර්මාණයේ විසිතුරු බවක් මෙන් ම අපූරු බවක් ද දක්නට ඇත. ඔහු තමා හොඳින් දන්නා භාෂාව උපයෝගී කොටගෙන ඉදිරිපත් කරන අත්දැකීම අප මෙතෙක් නොදුටු රසවත් බවකින් යුක්ත වේ. ඔහු භාෂාව යොදන අයුරු අපූරු ය. එය කියවන, අසන, දකින සහෘදයා ප්‍රමෝදයට පත් වෙයි.

සාහිත්‍ය නිර්මාණය සඳහා ප්‍රතිභාව අවශ්‍ය බව ඉහත ද පවසා ඇත. ප්‍රතිභාව පෝෂණය ලබන්නේ පරිකල්පන ශක්තියෙනි. පරිකල්පන ශක්තිය යනු කුමක් ද? එනම් ඇස්, කන්, නාසා ආදි කොට ඇති පංච ඉන්ද්‍රියයන්ට අරමුණු වන (ඇසට නම් පෙනෙන, කනට නම් ඇහෙන) විවිධ සිදුවීම් සිතට කා වැදී සිත තුළ යළි නිර්මාණය වීමෙන් නව සංකල්ප රූප මතු වීම යි. අප දකින්නේ සමන් පිච්ච මල් පොකුරක් යැ යි සිතමු. එම මල්වල සුන්දරත්වය, සුවඳ, පවිත්‍රතාව සමඟ අප සිත තුළ තවත් යමක් මැවේ. කිරිදත් පෙන්වා සිනාසෙන ළදරුවකුගේ සිනාව ඒ හා සමඟ ම අප සිතට නැඟෙන අයුරින් කවියාට සිය නිර්මාණය කළ හැකි ය. මේ සංකල්ප රූපය අප සිතේ මවන්නට කවියා තුළ ඇති දක්ෂතාව පරිකල්පන ශක්තිය ලෙස හැඳින්විය හැකි ය. ඉතා ම සුළු වස්තුවක් හෝ සිද්ධියක් ඇසුරින් සුවිශාල කලා ලෝකයක් මවන්නට කවියා සමත් වන්නේ ඔහු සතු පරිකල්පන ශක්තිය නිසා ය. පරිකල්පන ශක්තිය මෙන් ම ඒ හා බැඳුණ වින්දන ශක්තිය ද සාහිත්‍යකරණයේ දී තිබිය යුතු ය. සාහිත්‍ය නිර්මාණය සඳහා සාහිත්‍යකරුගේ හදවත නිරතුරු ව සංවේදී විය යුත්තේ එබැවිනි. අවට ලෝකයේ සියලු දෙයක ම විශේෂත්වයක් ඔහුගේ ඇසට ලක් වේ. සාහිත්‍යකරු නිරතුරු ව එබඳු කරුණු සඳහා ප්‍රතිචාර දක්වන්නකු විය යුතු ය. ජීවිතය ගැඹුරු ලෙස දකින්නකු විය යුතු ය.

සාහිත්‍යකරුවාගේ කුසලතාව ප්‍රදර්ශනය වන්නේ ඔහු අත්දැකීමක් තෝරා ගන්නා අයුරිනි. නවකතා, කෙටිකතා, නාට්‍ය, කාව්‍ය ආදි කවර සාහිත්‍යාංගයක් මඟින් වුව ද ඉදිරිපත් කෙරෙන අත්දැකීම තුළින් සහෘදයාට අපූරු ආස්වාදයක් ලබාදිය යුතු ය.

පහත දැක්වෙන කවිය විමසා බලමු.

මැදවත්තේ සෙල්ලම් පාරකි යන්ට
මල් පිපිලා සුවඳේ බැරුවා ඉන්ට
කඩා ගන්ට බැහැ අත රිදෙනව අපට
සාදු සාදු මල් පිපියන් හොඳ රුවට

ජනකවියකුගේ අපූරු අත්දැකීමක් මේ කවෙන් ඉදිරිපත් වේ. උක්ත අත්දැකීම ඕනෑ ම කෙනකු ලබා ඇත. ඇහැළ මලින් බර වූ ගස් ගොන්නක්, නාමලින් බර වූ නා වැටියක්, සපුමලින් බර වූ සුවඳ දස අත විහිදවන සපුගස් මණ්ඩියක්, නොඑසේ නම් පාර දෙපස මලින් පිරුණු මැයි ගස් පෙළක් නොදුටු අය ඇත් ද? සෞන්දර්යය ප්‍රිය කරන කවුරුත් මල් දෙස බලා තුටු වන්නට ඇත. එහෙත් කවියාගේ අත්දැකීම වඩා අපූර්වත්වයකට පත් වන්නේ අවට පරිසරයෙන් පිබිදුණු ඔහුගේ ප්‍රාර්ථනාවත් සමඟ ය. ඒ නිසා ම කවියෙන් කියැවෙන අත්දැකීමට අප පිවිසෙන්නේ කිසි දා අත් නොදුටු සුන්දරත්වයක් විඳිමිනි.

අත්දැකීම තුළින් රසිකයාට රසය ප්‍රදානය කළ යුතු ය. රසය මෙන් ම අර්ථාන්විත බව ද එම අත්දැකීමෙහි විය යුතු ය. එම රසය තාවකාලික ව හා මතුපිටින් ලැබෙන

රසයක් නොවිය යුතු ය. එසේ ම ජීවිතය, මනුෂ්‍යත්වය හා අවට පරිසරය යළිත් සිහියට නැගීම සඳහා සහෘදයා මෙහෙයවිය යුතු ය. අර්ථවත් බවත්, අපූර්වත්වයත් සමඟ විශ්වසනීය බව ද අත්දැකීමක තිබිය යුතු ය. උසස් සාහිත්‍ය කෘතියක් නම් එහි අත්දැකීම විය හැක්කක් ද? නැත් දැයි යන අදහසක් සහෘදයා තුළ පහළ නො වේ. වර්ෂ ගණනාවක් ජීවත් ව ලද නොහැකි ජීවිතාවබෝධයක් ලබා දෙන්නට සාහිත්‍යකරුවාට හැකි වන්නේ සැබෑ ජීවිතය ඔහු විසින් ඉදිරිපත් කරන බැවිනි.

සාහිත්‍යකරුවා තම අත්දැකීම සහෘදයා වෙත ගෙන යන්නේ භාෂාව මාධ්‍යය කොටගෙන ය. ලේඛකයකුගේ හෝ කවියකුගේ හෝ කුසලතාව ප්‍රකට වන්නේ ඔහු භාෂාව සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිත කරන අයුරිනි.

ගොඩමඩ දෙක ම සරුසාරය පලබරය
කටුරොද ගම්මාන තරමක පිටිසරය
ඒ ගම මැදින් ගලනා ගඟ මනහරය
කඩ මණ්ඩිය පිහිටියේ ගම කෙළවරය

සුදෝසුදු කාව්‍යයේ එන මේ කවියේ ඇත්තේ වචනවල මතු පිටින් කියැවෙන අර්ථය පමණි.

කටුරොද මඩ වගුරුවල මානෙල් ඕලු
මැණිකෙගෙ මුහුණ දකුමට පොරකන වාලු

සුදෝසුදු කාව්‍යයේ ම හීන්මැණිකේගේ මුහුණේ සුන්දරත්වය කවියා ව්‍යංග්‍යයෙන් පැවසූ අයුරු එහි දක්වේ. මානෙල් ඕලු ආදි මල් ඉතා පියකරු ය. ඊටත් වඩා මැණිකෙගේ මුහුණ පියකරු බව කවියා කියයි.

'මානෙල් ඕලු මැණිකෙගෙ මුහුණ බැලුමට පොරකනවාලු'

සුළඟට මල්වල ඇතිවන චලනය කුමට ද? මැණිකෙගේ මුහුණ බැලීමට ය. මෙසේ කවියා මානෙල් ඕලු පොරකන අයුරු හා මැණිකෙගේ මුහුණේ පියකරු බව විසිතුරු චිත්ත රූපයකට ගෙනෙන අයුරු මනහර ය.

යම් සාහිත්‍ය නිර්මාණයක් මුලින් ම මැවෙන්නේ කවියාගේ සිතෙහි ය. වචන වලින් රසිකයා වෙත පැමිණෙන්නේ යථෝක්ත චිත්ත රූප ම ය. මනසේ ඇතිවෙන එම නිර්මාණ හෙවත් පරිකල්පනය සාහිත්‍ය නිර්මාණයේ මූලික පදනම යි.

**මේ කවි පෙළ දෙස බලන්න.**

"පොඩි නැන්දා හිනාවෙවී
වෙලට ගෙනා මීකිරී

පොඩි මාමා වෙල අයිනේ
තියා තිබුණ මීකිරී

හා පැටියා රහ බලන්න
හොස්ස පෙවූ මීකිරි
කිරි මුට්ටිය ඇද හැලිලා
ඇඟ පුරාම මීකිරි
උඩින් පැන්න පාරේ ඇත
කරඹ කැලේ මීකිරි
නාගස් යට හෙවණ පුරා
හැම තැනෙක ම මීකිරි
කඳු අස්සේ ගෑවී ගිය
වලාකුළෙත් මීකිරි
ඇඟ උළලා වතු සුද්දා
පඳුරු පුරා මීකිරි
විලට පැන්න තැන කැටි කැටි
නෙළුම් ගහෙත් මීකිරි
ඇළෙයි දොළෙයි පෙණ නැඟ නැඟ
පාවෙයි තව මීකිරි"

මේ සියල්ල කවියාගේ සිතේ මැවුණු පරිකල්පනා ය. ඒවා සත්‍ය සිද්ධි නො වේ. එහෙත් රසිකයා සනහාලන්නට හා ආස්වාදය ලබා දෙන්නට එය සමත් වේ.

සාහිත්‍ය නිර්මාණය හා රසවින්දනය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී සංකල්පරූප මැවීමේ හැකියාව පිළිබඳ ව ද දත යුතු ය. චිත්තරූප යනුවෙන් හැඳින්වෙන්නේ ද සංකල්පරූප ම ය. සංකල්පරූපය යනු පාඨකයාගේ පසිඳුරන් මඟින් ඔහුගේ මනසට ඇතුළු ව ඔහු තුළ හැඟීම් ප්‍රබෝධ කරවීමට සමත් වන වාක් චිත්‍රයකි. උපමා හා රූපක මෙහි දී ප්‍රබල වේ. සංකල්ප රූප මැවීමේ දී උපකාරී වන උත්ප්‍රේක්ෂා, ස්වභාවෝක්ති ආදි අලංකාර ද ඇත.

"මුතු ඇට මෙනි ඇගේ දසන්"
"නා දලු වැනි දෙතොල්"

මෙසේ මෙන්, සේ, බඳු, යුරු, වැනි සමානවාචී නිපාත පද යෙදීමෙන් උපමා සකස් වේ. එබඳු පද නොමැති ව යෙදෙන නා දලු දෙතොල්, සඳ වත වැනි යෙදුම් රූපක අලංකාරයට නිදසුන් වේ. කිසියම් අවස්ථාවක්, හැඟීමක්, සිද්ධියක් පැහැදිලි හා ප්‍රබල ලෙස, සංක්ෂිප්ත ලෙස චිත්‍රණය කිරීම සංකල්පරූපවලින් සිදු වේ. කවියා උචිත උපමා හා රූපක භාවිත කිරීමෙන් අපූරු චිත්තරූප මවයි.

උත්ප්‍රේක්ෂා යනු කිසියම් දෙයක ඇති සැටිය යටපත් කොට වෙනත් ආකාරයකින් ඉදිරිපත් කිරීම යි.

පියකරු තෙනෙන් පැරදී පිවිසි වන විල
පිවිතුරු හසුන් එනලෙද යළි ගෙදිගු විල
විසිතුරු මෙපුර වර අඟනන් වෙමින් ලොල
පියොවුරු පටින් බැඳ වසතියි සිතේ බල

මේ පද්‍යයෙහි දැක්වෙන පරිදි කෝට්ටේ (ජයවද්දන) පුරයෙහි කාන්තාවෝ පියවුරු බැඳ ගනිති. මෙය සාමාන්‍ය සිදුවීමකි. එහෙත් කවියා මේ සිද්ධිය දකින්නේ කාන්තාවන්ගේ පියයුරුවලට පැරදී ගෙදිගුවිල් හැර ගිය හංසයන් යළි එහි කැඳවීම සඳහා තම පියයුරු රෙදි පටියෙන් බැඳ ගත් බවයි. කාන්තාවන්ගේ පියයුරු හංසයන්ට සමාන වන බව කවියා දැක්වූ ආකාරය යි.

කිසියම් දෙයක පවත්නා තත්ත්වය හෙවත් ඇති සැටිය නිරූපණය කෙරෙන්නේ ස්වභාවෝක්තිය මඟිනි.

වටින නොයෙක් බඩු ඇරගෙන ඇමදාම
වටින මිලට නොවිකුට කොට වෙළෙඳාම
සිටින ලියන් දැක සිහිකර බණදාම
වඩින කෝන් ගස් සෙවණේ නොරඳාම

මෙහි දැක්වෙන්නේ ගිරවාගේ ගමන් මඟෙහි හමුවන කෝන් ගස් සෙවණ පිළිබඳ වැණුමකි. මේ ස්ථානයෙහි රැස්ව සිටින්නෝ කාන්තාවෝ ය. ඔවුන් වටිනා විවිධ බඩු රැගෙන ඒවායේ වටිනා මිලට නොවිකුණා වෙළඳාම් කරමින් සිටිති. ඔවුන් දැක නොරැඳී යන්නැ යි ගිරවාට කියූ සැටි ය.

ගුත්තිල මූසිල වීණාවාදය පාඨකයාගේ මනස ඉදිරියට ගෙන ඒම සඳහා වෑත්තෑවේ හිමියෝ භාෂාව මනාව ප්‍රයෝජනයට ගත්හ. අර්ථ ශබ්ද හා විවිධ සිරිත් විරිත් භාවිතයෙන් උන්වහන්සේ එම වීණා වාදය අප ඉදිරියේ මැවූහ.

කිසියම් සිද්ධියක් පාඨකයාට ඉදිරිපත් කිරීමේ දී සාහිත්‍යකරුවා එම සිද්ධීන් හා සහභාගි වූ පුද්ගලයන් ද පාඨක අභිමුවට ගෙනේ. එවිට චරිත අප ඉදිරියේ සිදු වූ අයුරින් ම ඉදිරිපත් කෙරේ. නාට්‍යකරු, නළු නිළියන් වෙස් ගන්වා රඟ මඬලෙහි රඟ දැක්වීමෙන් ද කවියා උචිත වචන භාවිත කොට ඉදිරිපත් කිරීමෙන් ද සිද්ධිය අප ඉදිරියේ මවන්නට සමත් වේ.

ජූජක බමුණා අමිත්තතාපා බැමිණිය හා සෙසු බැමිණියන් අතර සිදු වූ සිද්ධි විද්‍යාචක්‍රවර්ති බුත්සරණ කෘතියේ දී අප ඉදිරියේ ඉදිරිපත් කරන සැටි බලන්න.

"අමිත්තතාපා නම් බැමිණි, සැමියාට සුව සේ මෙහෙ කොට සිත් සේ වෙසෙයි. මේ බලා එ ගමැ ළදරු බමුණෝ තම තමන්ගේ අඹුවන්ට රැහැණි ව කියන්නාහු. 'වෘද්ධ බමුණාට මෙවෙනි ස්ත්‍රියක් උඵ සිත් සේ මෙහෙ කොට වෙසෙයි. තෙපි අපට කවර මෙහෙ කරවු ද' යි කියා තම තමන්ගේ අඹුවන්ට ගහට කෙරෙති. එක් දවසක් අමිත්තතාපා නම් බැමිණිය තොට දී දැක එගමැ සෙසු බැමිණියෝ කියන්නාහු 'පච්කිළිය' තෝ දත් හුණු නර මහල්ලකුට මෙහෙ කෙරෙයි ද? මේ කඩදත් මහල්ලාට තී දුන් තීගේ දෙමව්පියෝ

තීට සතුරුවන්හ. තී උන්ට අප්‍රිය වන නියායැ. තෝ පින් නොකළ පවැත්තියක බන්දෙහි. තී ගිය ජාතියෙහි කවුඩුවන්ට පිඩු දුන් කලැ තී ලූ බත් කැයේ මහලු කවුඩුවකු වනැ."

"එසේ තමාට පරිභව බණන්නාවු ගැහැනුන් බලා හඬා වැලප මියුඬුහුරු ලා තමා පැනට ගෙන ගිය කළය ගල් කැටෙක පැහැර බිඳ පියා අත පෙරවැගෙනැ බමුණු මහල්ලාට තතනමින් දත්කමින් සාප කොට ද බෙණෙමින් ගෙට ගොස්. බමුණු මහල්ල, තා සේ වූ කෙළතොල්ලන් කෙරෙහි උන් විපාක අද ලදිමි. යා පත් සරණෙකැ මා ආයේ. අද මෙගමැ සක්දැරියන් එක්වැ ගෙනැ මා හිස බොල් කෙළ ඕනා සේ, මට උන් නොකී පරිභවයක් නැත. තා කෙරෙහි හිඳ මෙසේ වූ බස් අසන්නාට වඩා කර වැල්ලා ගෙනැ මිය යාම යහපතකැයි කිව ......."

බුත්සරණෙහි ම නාලාගිරි දමනය කතාවේ එන මේ කොටස බලන්න.

"රළු මතැත් මහ පොළොව අනුරාව දෙවමින්, ගිගුරු හඬින් මුළු ලොව තතුණුවමින්, කෝපයෙන් යදම් බිඳ සුණු විසුණු කෙරෙමින් බැඳලූ කඹය පෙරළී සිට ඇනලූ ඇන්මෙන් මහ පොළොව දදුරු කොට දොරටු අටුලු පවුරු පදනම් ඇනැ හෙළා සුණු විසුණු කෙරෙමින් අවුත් වීථියට වැද ගියේ ය."

සාහිත්‍ය කෘතියක භාෂා රීතිය, සන්දර්භය, විරිත හා රිද්මය හැඩගැස්වීමෙහි ලා සමාජයේ බලපෑම ද හේතු වේ. සම්භාව්‍ය සාහිත්‍යයේ ගද්‍ය මෙන් ම පද්‍ය කෘති ශ්‍රැති ගෝචර රටාවකින් ලියවුණේ එනිසා ය.

පහත දැක්වෙන කවිය විමසා බලමු.

"පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියසඑ දුට"

මේ කවියේ විරිත හා රිද්මය ද සරල ආකාරයෙන් ඉදිරිපත් කරන අයුරු සලකා බැලීමේ දී ද උක්ත කාරණය සනාථ වේ.

සාහිත්‍ය රසාස්වාදයේ තවත් සුවිශේෂ අවස්ථාවක් විචාරය නමින් හැඳින්වේ. සාහිත්‍ය විචාරයෙන් අපේක්ෂා කරනුයේ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ විධිමත්, බුද්ධිගෝචර විග්‍රහ ඉදිරිපත් කිරීම යි. සාහිත්‍ය විචාරයට නිශ්චිත අරමුණක් තිබිය යුතු ය. ඉන් සිදුවන්නේ යම් කලා කෘතියක අරුත පැහැදිලි කිරීම හා නිසි ලෙස රස විඳ ගැනීමට ඉඩ දීම ය.

ප්‍රස්තුත නිර්මාණයේ අරුත් පැහැදිලි ව තේරුම් ගෙන කවියාගේ හෝ නිර්මාතෘගේ අදහස තේරුම් ගෙන ඔවුන් විසින් සිය අභිප්‍රේත අර්ථය පැහැදිලි කිරීම සඳහා ගත් ක්‍රියා

මාර්ග මොනවා ද? ඒ ක්‍රියා මාර්ග කොතෙක් දුරට සාර්ථක ද? අසාර්ථක නම් ඒ කවර අංග ද? ඊට හේතු මොනවා ද? යොදා ගත් භාෂාවේ ප්‍රබලතා සහ දුබලතා මොනවා ද? ආදි වශයෙන් සද්භාවයෙන් සිදු කෙරෙන විවරණයක් සාහිත්‍ය විචාරයේ දී සාධක සහිත ව ඉදිරිපත් වේ. පහත සඳහන් කරුණු ද සාහිත්‍ය විචාරයේ දී උපයෝගී කරගත හැකි ය.

අර්ථවත් විචාරයක් උදෙසා කාව්‍යයේ භාෂාව වැදගත් වන බව ඇතැම් අපරදිග විචාරකයන්ගේ ද මතය යි. මේ අනුව කාව්‍ය භාෂාව පිළිබඳ කෙරෙන විග්‍රහය අවශ්‍ය වේ. පහත දැක්වෙන කවිය මෙහි දී විමසා බලමු.

"බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට
මැනලා වී ටිකක් දුන්න යි මල්ලක ට
ගන්දෝ නොගන් දෝ කියලා සිතුණි මට
මැනල ද පුතේ කිරි දුන්නේ මා නුඹට"

මේ කවියෙන් ඉදිරිපත් කෙරෙන්නේ දුකට හා කළකිරීමට පත් වූ මවකගේ දුක්ඛාලාපය යි. කවියේ වස්තු විෂය හා එහි අරුත උද්දේශය යනුවෙන් හැඳින්විය හැකි ය. මෙය එහි වස්තු විෂයයයි.

මේ කවියේ මව පත්ව සිටින අවස්ථාව දෙස සානුකම්පික ව බැලීම දක්නට ලැබේ. ලේඛකයකුට තම අනුභූතිය හෙවත් අත්දැකීම දෙස තමාට අභිමත ආකාරයකින් බැලිය හැකි ය. මෙසේ ලේඛකයා භාෂාව උපයෝගී කොටගෙන එම අත්දැකීම පිළිබඳ සිය ආකල්ප ද ඉදිරිපත් කරයි. කවියා තමා තෝරා ගත් වස්තු විෂය හෙවත් අත්දැකීම් ඉදිරිපත් කරන ආකාරය භාවාකල්පය නමින් හැඳින් වේ. ලේඛකයා තම නිර්මාණය රසවිඳින රසිකයා කෙරෙහි දක්වන ආකල්පය ද වැදගත් ය. පාඨකයා බුද්ධිමතකු ලෙස සලකා ඔහුගේ උචිතානුචිත විවේක බුද්ධිය පුබුදුවා ලන ලෙස මේ කවිය සැකසී ඇත. මෙසේ රස විඳින්නා කෙරෙහි ලේඛකයාගේ ආකල්පය යොමුවන්නේ ද භාෂාව, වචන තෝරා ගැනීම, පෙළ ගැස්වීම, හැසිරවීම ඔස්සේ ය. එමගින් ලේඛකයා අත්දැකීම පිළිබඳ සිය ආකල්පය සහ හැඟීම් ඉදිරිපත් කරයි.

මාතෘ ප්‍රේමය උතුම් කොට දැක්වීම මේ පද්‍යයේ අරමුණ යි. කවියා සිය නිර්මාණය තුළින් රසිකයාට ඉදිරිපත් කරන මූලික අරමුණ අභිප්‍රාය නමින් හැඳින්වේ.

මේ අනුව සාහිත්‍ය නිර්මාණය හා විචාරය එකිනෙක හා බැඳුණු අංග දෙකක් බව පැහැදිලි වේ. මේ දෙක්හි නියැලීම නිර්මාණකරුවාගේ හා සහෘදයාගේ අරමුණු විය යුතු ය.

## ක්‍රියාකාරකම 01

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. කවියකු තුළ පැවතිය යුතු මූලික ගුණාංග කෙටියෙන් හඳුන්වා දෙන්න.
2. සාහිත්‍යකරණයේ දී තෝරා ගැනෙන අත්දැකීම වැදගත් වන්නේ කුමන කරුණු නිසා ද?
3. උපමා හා රූපක නිදසුන් දෙක බැගින් දෙන්න.

## ක්‍රියාකාරකම 02

**i පහත සඳහන් පද විසන්ධි කර දක්වන්න.**

| | |
|---|---|
| සමානාර්ථවත් | ව්‍යංග්‍යාර්ථය |
| සතතාභ්‍යාසය | ස්වභාවෝක්ති |
| ප්‍රත්‍යවේක්ෂණය | භාවාකල්පය |
| ජීවිතාවබෝධය | උචිතානුචිත |

**ii පහත සඳහන් පද සන්ධි කර දක්වන්න.**

| | | |
|---|---|---|
| සූර්ය | + | උදය |
| අති | + | උත්කෘෂ්ට |
| අති | + | උදාර |
| පංච | + | ඉන්ද්‍රිය |
| පූර්ව | + | ආචාර්ය |
| කෘත | + | උපකාර |
| රස | + | ආස්වාදය |
| වාච්‍ය | + | අර්ථ |

### පැවරුම

1. කැමති මාතෘකාවක් අනුව කවියක්, ගීතයක්, කෙටිකතාවක් වැනි නිර්මාණයක යෙදෙන්න.
2. පන්තියේ බිත්ති පුවත්පත සඳහා ඔබ උගත් කරුණු ආශ්‍රයෙන් 'සාහිත්‍ය ලෝකය' නමින් අතිරේකයක් පිළියෙල කරන්න.
3. සාහිත්‍ය නිර්මාණය හා විචාරය සම්බන්ධ ලිපි සොයා ගෙනවුත් සාහිත්‍ය සමිතියට ඉදිරිපත් කරන්න.

මෙවැනි කවි පන්ති සොයා ඒවායේ රසය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

## උදය

1. ඇසෙන්නෙ කා කා හඬ සෑම පැත්තෙන්
නැඟෙවු කියන්නා වැනි දූන් ම නින්දෙන්
දොරින් අඩක් මේ ඇරියා ම එන්නේ
සිහිල් සුළං 'ආයුබෝවන්' කියා මෙන්

2. පියා හඹත් කූඩුවලින් කුරුල්ලෝ
ඉතා ම මීරි යි හඬ දූන් ඔවුන් ගේ
සුළං වැදිමෙන් උදයේ සිහිල් වූ
අලුත් පණක් ගස්වලටත් ලැබී - ලා

3. සෙමෙන් සෙමෙන් මල් කැකුළුත් තොසින් මෙන්
පිපී-ගෙන යි එන්නේ නෙළුම් විලේ මේ
අහස් දෙසේ රෝස ගසත් සිනා සී
බැලීමටයි දූන් සැරසී සිටින්නේ

4. දිසාවෙනැයි මේ හිරු එන්නේ පායා
හැරී සිටී සූරියකත් ගසේ මල්
රැසුයි දිළෙන්නේ ලණු මෙන් ඇදී - ලා
මඟුල් ගෙයක් දෝ ලොව මේ වෙලාවේ

5. 'උතුම් වෙලාවැ' යි කියමින් සියල්ලෝ
යෙදෙත් නොලස් වී ම තමන් ගෙ කම්හි
ඇඟත් සැහැල්ලු යි සිතෙහිත් බරෙක් නැ
බලන්න පත් පොත් මට මේ වෙලාව යි

කුමාරතුංග මුනිදාස